# මාඕ සේතුංගේ අධ්‍යාපන දර්ශනය

**නෙළුම්දෙණියේ ධම්මදස්සි හිමි**

## හැඳින්වීම

### මාඕ සේතුංගේ ළමා කාලය සහ උපත

මාඕ සේතුං උපත ලැබුවේ 1893 අප්‍රේල් 26 දින, චීනයේ හුනන් පළාතේ ෂාශෝෂාන් නගරයෙහිදීය. ඔහු ගොවිපලක් හිමිකර සිටි මාඕ එන් (Mao Yichang) සහ ඔහුගේ භාර්යාව වන වෙන් සියිමෙයි (Wen Qimei) යන දෙමව්පියන්ට උපන් පුත්‍රයෙකි. ඔහුගේ පවුල සාම්ප්‍රදායික ව්‍යාපාරික ගොවි පවුලක් විය (Fairienk, 2006: 366).

### අධ්‍යාපනය

මාඕගේ ආරම්භක අධ්‍යාපනය ලැබුණේ දේවස්ථාන පාසලකිනි. ඔහු කුඩා කාලයේ සිටම චීන සාම්ප්‍රදායික සාහිත්‍යය හා කලාව ගැන උනන්දුවක් දැක්වූවෙකි. පසුව ඔහු හුනන් පළාත් මූලික පාසලකට සහ නන්කයි සාමාන්‍ය පාසලකට එක්වීය. එහිදී ඔහු නව අදහස්, ජාතිකවාදය, ප්‍රජාතන්ත්‍රවාදය සහ සමාජවාදය ව්‍යාකූල විමසුමකට ලක් කළේය. 1918 දී ඔහු හුනන් ප්‍රථම සාමාන්‍ය පාසල (Hunan First Normal School) වෙතින් උසස් අධ්‍යාපනය සමඟ උපාධියක් ලබා ගත්තෙකි. අධ්‍යාපනය තුළදී මාඕ රුසියාවේ බෝල්ෂෙවික් විප්ලවය පිළිබඳ දැඩි ආකර්ෂණයක් දැක්වීය. ඔහු එවකට චීන සමාජයෙහි අසමතා සහ කෘෂිකර්මය සම්බන්ධ ගැටලු පිළිබඳ වැඩි අවධානයක් යොමු කළේය (Spence, 1999: 17–22).

1913-1918 දක්වා මාඕ ගුරුවරුන්ගේ පුහුණු පාසලේ අධ්‍යාපනය ලැබීය. මෙහිදී ඔහු විප්ලවවාදී අදහස් තව තවත් පුළුල් කිරීමට පටන් ගත්තේය. 1917 රුසියානු විප්ලවයෙන් ඔහු විශ්මයට පත්ව සිටි අතර ක්‍රි.පූ. 4 වන සියවස වන විට චීන දර්ශනය ''නීතිමය'' යනුවෙන් හැඳින්වීය. මාඕ සේතුං දර්ශනය "නීතිමය'' යනුවෙන්

හඳුන්වා දී ඇත්තේ, එය ප්‍රායෝගික ක්‍රියාවලියක් සහිත දර්ශනයක් ලෙසය. ඔහුගේ අදහසට අනුව දර්ශනය යනු ක්‍රියාකාරිත්වය සමඟ බැඳී සිටිය යුතු දෙයකි. කල්පනා මට්ටමෙන් පමණක් නොව සමාජය පරිවර්තනය කිරීමේ මෙවලමක් වශයෙන් ද භාවිත කළ යුතු දෙයකි. මෙය මාඕ සේතුංගේ "ප්‍රායෝගිකත්වය පිළිබඳ විවාදය'' "ප්‍රතිවාදය පිළිබඳ විවාදය'' (On Practice and On Contradiction-1937) නැමැති කෘතිවලින් පැහැදිලි වේ. ඔහුට අනුව දර්ශනය යනු සත්‍යය ලබා ගැනීම සඳහා ක්‍රියාත්මක ක්‍රියාවලියකි. එමගින් විප්ලවීය ක්‍රියාමාර්ග අවශ්‍ය මට්ටමට නැංවිය හැකිය. එබැවින් ''නීතිමය'' ලෙස හඳුන්වන්නේ එම සමාජයේ වෙනස්කම් හඳුනාගෙන එය පරිවර්තනය කිරීමට ක්‍රමෝපායිකව ක්‍රියා කරන්නට උපකාරී වේ යන්නයි.

**රාජධානිවල පැවති සාම්ප්‍රදායික අධ්‍යාපනය**

1. හන් රාජධානිය සමයේ අධ්‍යාපන ක්‍රම (206 BCE–220 CE)

හන් රාජධානියේදී රජයේ පරිපාලනය සඳහා පදනම් වූ විභාග පද්ධතියක් හඳුන්වා දී ඇත. මෙහිදී "සික්ස් ක්ලාසික්ස්" (Six Classics) ලෙස හැඳින්වූ කෘති පදනම්ව භාෂා හා සාහිත්‍යය ඉගෙනුම් කළේය.

2. තාන් රාජධානියේදී (618–907 CE)

තාන් යුගයේදී සාම්ප්‍රදායික විභාග පද්ධතිය වඩාත් සංකීර්ණ වූ අතර, කවි හා සෙසු සාහිත්‍යමය කෘතිවලට දැඩි අවධානයක් ලබා දී ඇත. මෙම පද්ධතියෙන් ව්‍යාකරණය, අර්ථ දැක්වීම් සහ ලිවීමේ නිපුණතා වර්ධනය විය (Elman, 2002).

3. සෝන් රාජධානිය සහ ඉන් පසුව (960–1279 CE)

සෝන් යුගයේදී විභාග ක්‍රමය වඩාත් ස්ථිර සහ නිවැරදි සන්ධානයක් ලබා දුන් අතර (Four Boks and Five Classics) කියවීම අත්‍යවශ්‍ය විය. මෙය සාම්ප්‍රදායික චීන භාෂාව ඉගැන්වීමට ද ඉතා බලවත් මූලිකයක් විය (Ebrey, 2003).

**මාඕ සේතුංගේ අධ්‍යාපන දර්ශනය**

මාඕ සෙතුන් (1893 -1976) චීන සමාජවාදී විප්ලවයේ නායකයා ලෙස, අධ්‍යාපනය සාමාජිකයන්ගේ සම්පූර්ණ සංවර්ධනය පිළිබඳ සලකා බැලීය. ඔහුගේ අධ්‍යාපන දර්ශනය පහත කරුණු මත පදනම් විය.

**ප්‍රායෝගික අත්දැකීම් මත පදනම් වීම**

මාඕගේ අදහස අනුව, දැනුම ප්‍රායෝගික අත්දැකීම් මගින් ලබාගත යුතුය. ඔහුගේ මතය වූයේ,

"ප්‍රායෝගික අත්දැකීම් දැනුමට මූලාශ්‍රයයි; ප්‍රායෝගික අත්දැකීම් දැනුම සංවර්ධනයට ප්‍රේරණයයි; ප්‍රායෝගික අත්දැකීම් දැනුම පරීක්ෂා කිරීමේ එකම මාර්ගයයි; සහ ප්‍රායෝගික අත්දැකීම් දැනුමේ අරමුණයි'' යනුවෙනි.

**කම්කරු, ගොවි හා සිසුන්ගේ ඒකාබද්ධතාවය**

මාඕ අධ්‍යාපනය තුළ කම්කරු, ගොවි හා සිසුන්ගේ කාර්යභාරයන් ඒකාබද්ධ කිරීමට උනන්දු විය. ඔහුගේ අදහස වූයේ, සමාජවාදී සමාජයක පුද්ගලයෙකු, කම්කරු, ගොවි හා සිසුවකු ලෙස කටයුතු කළ යුතු බවයි.

**මාක්ස් සමඟ සම්බන්ධතාවය**

මාඕගේ මතය වූයේ "අපි ගුරුවරුන් වීමට කැමති නම්, පළමුව ශිෂ්‍යයන් විය යුතුය'' යනුවෙනි. එනම්, ජනතාවගෙන් ඉගෙන ගැනීමෙන් පසුව, ඔවුන්ට අධ්‍යාපනය ලබාදිය යුතුය. වර්ෂ 1949 දී මාඕ සේතුං චීන රජයේ දේශපාලන බලය ලබා ගැනීමෙන් අනතුරු ව මාක්ස්වාදී අධ්‍යාපන දාර්ශනික මතය අනුව, චීන අධ්‍යාපනය හැඩගස්වන ලදී. චීනයේ සාම්ප්‍රදායික භාෂා ඉගෙනුම් අධ්‍යාපනය යනු (Traditional Language Education in China) වර්ගීකරණයෙන් දැක්විය හැක්කේ Classical Chinese (Wényánwén) හෝ (Literary & Chinese) ලෙස හැඳින්වෙන භාෂාව පිළිබඳ අධ්‍යාපනය ලෙසයි. මෙය තරමක් සංකීර්ණ සහ විශේෂිත වූ භාෂාවක් වන අතර, රාජ්‍යයේ

විශේෂයෙන් ගුරුකල් Confucian & Academies තුළ භාවිත වී ඇත. 18 වන සියවසට පෙර, චීන අධ්‍යාපනය ප්‍රධාන වශයෙන්ම කොන්ෆිසියානු වාදය (Confucianism) මත පදනම් වූ අතර, Classical Chinese භාවිතය කෙරෙහි අවධානය යොමු විය. මෙය වඩාත් පැහැදිලි වන්නේ "චීන රාජ්‍ය විභාග පද්ධතිය" හෙවත් Imperial Examination System හරහාය. මෙම විභාගවල සාර්ථක වීම සඳහා (Classical Chinese) සාහිත්‍යය, විශේෂයෙන්ම Four Book and Five Classics පිළිබඳ දැනුමක් තිබිය යුතු විය (ලියැං, චැං. පුරාණ චීනයේ අධ්‍යාපනය) (යුනෙස්කෝ, 1955ඃ 101-120).

Four Book and Five Classics

මෙම කෘති නවීන කාලීන චීන විභාග පද්ධතියේ පදනමක් විය. Song රාජධානියේදී දාර්ශනික Zhu Xi විසින් මෙය ව්‍යුහගත කර ඇත. එහි අන්තර්ගතයන් පහත දැක්වේ.

- The Great Learning - නායකත්වය, නීතිගරුක බව සහ මානසික වර්ධනය පිළිබඳ විග්‍රහයක් Zhu Xi විසින් විශාල විවරණයක් සමඟ ව්‍යක්ත කර ඇත.
- The Doctrine of the Mean - මධ්‍යස්ථතාවය සහ යථාර්ථ ජීවිතය පිළිබඳ දාර්ශනික විග්‍රහයකි.
- The Analects - (Confucius) විසින් ප්‍රකාශ කළ ප්‍රධාන වචන හා සාකච්ඡා එකතුවකි.
- Mencius- මෙන්සියස් (Mencius) නමැති දාර්ශනිකයාගේ න්‍යාය හා සාකච්ඡා

Five Classic

මෙම කෘති පහ Zhou යුගයේ සිට ක්‍රමයෙන් සංස්කරණය කර ඇත. එය වඩාත් පුරාණ, දාර්ශනික, නීතිමය සහ භාවනාමය දැනුමකට අයත්ය.

1. Classic Poetry

කවි හා ගී 305ක් යටතේ සමාජය, ආගම, විවාහය පිළිබඳ නිරූපණ විස්තර වේ (Waley, A.1937.12).

2. Classic of Documents

පුරාණ චීන නීති, පාලන පදනම්, හා රජවරුන්ගේ දැක්ම පිළිබඳ විස්තර වේ (Legge, J.1865.3).

3. Book of Rites

සාම්ප්‍රදායික චීන සමාජයෙහි ආචාර, රීති සහ සමාජ ආකෘති විස්තර වේ (Legge,1885.17).

4. Chng or Classic of Changes

දාර්ශනික දැක්මක් සහ ජීවිතයේ වෙනස්කම් පිළිබඳ අනාවැකි (Yin–Yang) සංකල්පය මෙයින් ආරම්භ වේ.

5. Spring and Autumn Annals

Lu රාජධානියේ ඉතිහාස පිළිබඳ සටහන් (722–481 BCE) Confucius විසින් මෙහි සකසා ඇත (Legge,1872).

විශේෂයෙන්ම කොන්ෆියුෂස් (Confucius) ආගමික හා දාර්ශනික සම්ප්‍රදායන්ට ඇලුමක් විය. මීට වසර දහසකට වැඩි කාලයක සිට චීන භාෂාව හා සාහිත්‍යය පදනම්ව ඉගෙනුම් ක්‍රම දියුණු විය. වර්ෂ 1949 දී මාඕ සේතුං චීන රජයේ දේශපාලන බලය ලබා ගැනීමෙන් අනතුරු ව මාක්ස්වාදී අධ්‍යාපන දාර්ශනික මතය අනුව, චීන අධ්‍යාපනය හැඩගස්වන ලදී. ඉහත සඳහන් පරිදි සාම්ප්‍රදායික අධ්‍යාපනය වෙනුවට, අධ්‍යාපනයේ ප්‍රායෝගික භාවිතය පිළිබඳව මූලිකත්වය දෙන ලදී. නවීන විද්‍යාවේ දියුණුව සහ පොදුවේ ඉගෙනීම යනුවෙන් මාඕ අදහස් කරන්නේ තාක්ෂණය, විද්‍යාව සහ අධ්‍යාපනය, ජනතාවගේ වාසියට භාවිත කළ යුතු බවය. ඔහුගේ දර්ශනයේදී විද්‍යාව, සීමිත ව්‍යාපාරික හෝ බුද්ධිමය කණ්ඩායම් සඳහා පමණක් නොව, ජනතාවගේ ජීවිත දියුණුව සඳහාද යොදාගත යුතු මූලික ක්‍රමවේදයක් ලෙස සඳහන් කර ඇත.

පොදුවේ ඉගෙනීම (Mass Line Education) මාඕගේ වැදගත් සංකල්පයකි. මෙහිදී ජනතාව සමග ඍජුවම සම්බන්ධ වීම, ඔවුන්ගේ අත්දැකීම් හා අවශ්‍යතා දැන ගැනීම, එමගින් ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග සංවර්ධනය කිරීම සිදු වේ. මොහු සඳහන් කරන පරිදි විද්‍යාව හා තාක්ෂණය ජනතා ජීවිතය යහපත් කිරීම සඳහා භාවිත කළ යුතුය. ඉගෙනීම හා දැනුම සියලු ජනතාවට විවෘත විය යුතුය. නවීන විද්‍යාත්මක සංකල්ප ජනතාවගේ භාවිතයට ගෙන ඒම අවශ්‍යය. මෙතුමා සලකනු ලැබුවේ, දෑත්වලින් කරන කුසලතා වැඩිදියුණු කිරීමයි. එමගින් ප්‍රායෝගිකව අත්දැකීම් අවස්ථා ලබා දීම ප්‍රමුඛ විය (Schram,1999: 87-85). ඒ අනුව පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරන ලදී.

1. පුද්ගලයා තුළ පූර්ණ වර්ධනයක් ඇති කිරීම
2. සම අධ්‍යාපන අවස්ථා සංකල්පයට ප්‍රමුඛතාව ලබා දීම
3. වෘත්තීය හා තාක්ෂණික අධ්‍යාපනය වැඩිදියුණු කිරීම
4. අධ්‍යාපනය සඳහා ඉහළ ආයෝජනයක් ලබා දීම
5. අධ්‍යාපනය සඳහා මූල්‍යමය ආධාර ලබා දීම

1. පුද්ගලයා තුළ පූර්ණ වර්ධනයක් ඇති කිරීම

මාඕ සේතුංගේ අධ්‍යාපන දැක්මට අනුව අධ්‍යාපනය යනු පුද්ගලයාගේ මානසික, භෞතික, සමාජීය, ව්‍යාවහාරික සහ නීතිමය වශයෙන් සම්පූර්ණ වර්ධනයක් සඳහා උපකාරී විය යුතු ක්‍රියාවලියකි. ඔහුට අනුව, අධ්‍යාපනය මගින් නව සමාජයක් ගොඩනගන සූදානමක් ලබාදිය යුතුය (Emily Hannum,1999: 193–211).

2. සම අධ්‍යාපන අවස්ථා සංකල්පයට ප්‍රමුඛතාව ලබාදීම

මාඕ සේතුං බලගැන්වූ සමය තුළ, විශේෂයෙන්ම ග්‍රාමීය ප්‍රදේශවල දරුවන්ට නොමිලේ අධ්‍යාපන අවස්ථා ලබාදීම සඳහා වැඩි අවධානයක් යොමු විය. ධනවත් පන්තියට පමණක් සීමා වූ අධ්‍යාපන පද්ධතියක් විකාසනය වීම වැළැක්වීම ඔහුගේ අරමුණක් විය.

3. වෘත්තීය හා තාක්ෂණික අධ්‍යාපනය වැඩි දියුණු කිරීම

මාඕ අවධානය යොමු කළ තවත් මූලික අංගයකි, වෘත්තීය හා තාක්ෂණික අධ්‍යාපනය. කාර්මික ව්‍යාපාර හා කෘෂිකර්මය වැනි ක්ෂේත්‍ර සඳහා උසස් පුහුණුවක් ලබාදීමෙන්, රටේ ආර්ථික සංවර්ධනය වේගවත් කිරීම ඔහුගේ අරමුණ විය.

4. අධ්‍යාපනය සඳහා ඉහළ ආයෝජනයක් ලබාදීම

රජයේ ආධාරය හා සම්පත් අධ්‍යාපන ක්ෂේත්‍රයට යොමු කිරීම මඟින්, අධ්‍යාපන පහසුකම් ව්‍යාප්ත කර, තත්ත්වය වර්ධනය කිරීමේ අරමුණ මාඕගේ ප්‍රතිපත්තියකින් එකක් විය.

5. අධ්‍යාපනය සඳහා මූල්‍යමය ආධාර ලබා දීම

විශේෂයෙන්ම අඩු ආදායම් පවුල්වලින් පැමිණෙන දරුවන්ට, ආධාර හා අත්වැල සැපයීම මගින් අධ්‍යාපනය ජාතික ව්‍යාප්තියක් සහ වාසියක් ලබාදීම මාඕගේ ප්‍රධාන අරමුණකි (Kwong, 15(1), 27-44).

**මාඕ සේතුංගේ අධ්‍යාපනයේ අරමුණු**

**යහපත් ආකල්ප වර්ධනය**

යහපත් ආකල්ප වර්ධනය තුළින් සමාජයේ යහපත් පුරවැසියන් බිහි කිරීම මාඕ සේතුං හඳුන්වා දුන් අධ්‍යාපනයේ ප්‍රධාන අරමුණකි. මේ තුළින් පුද්ගලයාගේ අධ්‍යාත්මික සංවර්ධනය තුළින් යහපත් සමාජයක් බිහි කිරීමට උත්සාහ දරා ඇත.

- සදාචාර පුහුණුවක් ලබා දීම,
- මාතෘ භූමියට ආදරය කිරීම,
- පක්ෂයට ආදරය කිරීම,
- ජනතාවට ආදරය කිරීම,

වැනි විෂයයන් ඉගැන්වීම් ප්‍රාථමික පාසල්වල විෂයමාලාවට ඇතුළත් කර කුඩා අවධියේ සිට ම පුරුදු පුහුණු කිරීම තුළින් ඔවුන් අනාගතයේ යහපත් පුරවැසියන් බවට පත් කළ හැකි යැයි ඔහු විශ්වාස කළේය.

## පුද්ගල අවශ්‍යතා අනුව අධ්‍යාපන රටාවක් අනුගමනය කිරීම

රටෙහි විවිධ පෙදෙස්වල ජීවත් වන ජනතාවට එම ප්‍රදේශ තුළින් තම අවශ්‍යතා ඉටු කර ගැනීම උදෙසා විශේෂිත වූ අවශ්‍යතා ක්‍රමයක් මෙහි දක්නට ලැබේ. එනම්, කෘෂිකාර්මික පෙදෙස්වල ජීවත් වන ගැමියන් තම දරුවන් හැකි ඉක්මනින් ගොවිතැන් කටයුතු සඳහා සම්බන්ධ කර ගැනීමට උත්සාහ ගන්නා අතර ඔවුන්ට තම ගම් ප්‍රදේශයේ ම රැකියා ඇති බව ඔවුහු දනිති. මේ හේතුවෙන් අධ්‍යාපනය තුළින් මේ සඳහා විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කරයි. එනම් අස්වනු නෙලන කාලවලට නිවාඩු ලබා දීම සිදු කරයි.

පුද්ගලයා තුළ ද පවතින විවිධ දක්ෂතා දියුණු කිරීම සඳහා වෘත්තීය හා තාක්ෂණික කුසලතා වර්ධනය කරන පාසල් වර්ධනය කරනු ලැබීය. මේ සඳහා 1976 දී තාක්ෂණික හා කාර්මික අධ්‍යාපනය යළි පණ ගැන්වීම සිදු කරනු ලැබීය.

## වෘත්තීය හා තාක්ෂණික අධ්‍යාපනය වැඩි දියුණු කිරීම

වෘත්තීය හා තාක්ෂණික අධ්‍යාපනය තුළින් රට සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය ශ්‍රමිකයින් පුහුණු කරනු ලැබේ. 1986 දී වෘත්තීය අධ්‍යාපන පනතත නිකුත් කරනු ලැබීය. වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයට උසස්තම වෘත්තීය පාසල්, ද්විතීයික කුසලතා පාසල්, වෘත්තීය උසස් පාසල්, රැකියා සොයන මධ්‍යස්ථාන හා අනෙකුත් වැඩිහිටි කුසලතා සහ සමාජ පුහුණු අභ්‍යාස ආයතන මේ වර්ගීකරණයට ඇතුළත් වේ.

මෙම වෘත්තීය පුහුණු පාසල්වලින්, කෙළින්ම රැකියා සඳහා අවශ්‍ය කුසලතා සහිත ප්‍රායෝගික හැකියා වර්ධනය වූ දක්ෂ ශිල්පීන් පුහුණු කිරීම කරනු ලැබේ. චීනයේ වේගයෙන් ප්‍රසාරණය වන කර්මාන්ත හා ගොඩනැගිලි ක්ෂේත්‍රවල රැකියා සඳහා පුහුණු ශිල්පීන් මෙම ආයතනය මගින් සැපයේ. 1986 වන විට බහුතාක්ෂණික ආයතන 668,000 ක් ක්‍රියාත්මක වුවද සෑම වසරකම ඉහළ යන ඉල්ලුමට සරිලන පුහුණු ශිල්පීන් සැපයීම වෙහෙසකාරී ක්‍රියාවලියක් විය. මේ නිසා කෙටි කාලීන පාඨමාලා, නිවාඩු කාල පාඨමාලා, සතිඅන්ත පාඨමාලා හා සේවාස්ථ පුහුණු පාඨමාලා ආදී විවිධ ක්‍රම මගින් වෘත්තීය හා තාක්ෂණික නිපුණතාව ලබාදීමට කටයුතු යොදා ඇත.

### ප්‍රායෝගික අධ්‍යාපනයට මූලිකත්වය ලබාදීම

යමක් ප්‍රායෝගිකව සිදුකිරීම තුළින් ඒ පිළිබඳව මනා අවබෝධයක් ලබාගත හැකියි. මෙහිදී මාඕ සේතුං තම රටේ සංවර්ධනය උදෙසා පාසල් අධ්‍යාපනය තුළින් ප්‍රායෝගික අධ්‍යාපනයට ද නැඹුරුතාවක් දක්වා තිබේ. හතරවන වසර ආරම්භයේ සිට ඵලදායි ලෙස ශ්‍රමය වැය කිරීම සඳහා එක සෙමෙස්තරයකට සති දෙක බැගින් අධ්‍යාපනයට ගැළපෙන අයුරින් ගොවිබිම් හෝ වැඩපළවල්වල සම්බන්ධ වී ප්‍රායෝගික අත්දැකීම් ලබාදීමට අවස්ථාව සලසා දී තිබේ.

### පාඨමාලා ප්‍රතිසංස්කරණය

ඉක්මනින් ඉගෙන ගැනීමට හා කෙටි පුහුණුවක් මගින් සේවයට යොදවා ගත හැකි ලෙස පාඨමාලා ප්‍රතිසංස්කරණය කිරීම සිදුකරනු ලැබීය. එමගින් ජනතාවට අවශ්‍ය සේවාවන් කඩිනමින් ලබාදීමට පියවර ගනු ලැබීය. අධ්‍යාපනය වඩාත් ප්‍රායෝගික සහ සැමට ළඟා වීමට හැකිවන පරිදි චීන අක්ෂරයක් වඩාත් සරල කරන ලදී. පාඨමාලා ප්‍රතිසංස්කරණය කිරීම සිදුවූ ආකාරය මෙසේ විමසා මූලික වෛද්‍ය පුහුණුවක් ලබා දී පාවහන් රහිත වෛද්‍යවරුන් (Bare foot Doctors) වැනි රැකියා බිහි කරන ලදී. වෛද්‍යවරුන්ට දෙන ලද පුහුණුවෙන් ජනතාවට නිතර වැළඳෙන උණ, සෙම්ප්‍රතිශ්‍යාව, බඩේ අමාරුව, පාචනය වැනි රෝගවලට ප්‍රතිකාර කිරීමට හැකි විය. මේ සේවාවෙන් ඈත ගම්වල පවා වෛද්‍ය පහසුකම් ලැබීම නිසා ප්‍රාථමික රෝගවලට ඉක්මනින් ප්‍රතිකාරය ලැබුණි. පවුල් සෞඛ්‍ය සේවිකාවන්ගේ වින්නඹුවන්ගේ සේවාව කිරීමට අවශ්‍ය පුහුණුව ලද ඔවුන් ගෙයින් ගෙට ගොස් දැනුවත් කරනු ලැබීය.

මාඕ සේතුං (Mao Zedong) චීනයේ 1949 සිට 1976 දක්වා අධිපතිභාවය දැරූ අතර ඔහුගේ අධ්‍යාපන ප්‍රතිපත්තිවලට දැඩි ලෙස දේශපාලන සහ සමාජවාදී අදහස් ආශ්‍රය වූයේය. ඔහුගේ අධ්‍යාපන ප්‍රතිපත්තිය හා එය ක්‍රියාවට නැංවීමේ ක්‍රියාමාර්ග පහත පරිදි වේ:

### මාඕගේ අධ්‍යාපන ප්‍රතිපත්ති

මාඕ සේතුංගේ ප්‍රධාන අධ්‍යාපන දර්ශනය වන්නේ අධ්‍යාපනයේ ප්‍රධාන අරමුණ විය යුත්තේ සමාජවාදී ආකල්ප වර්ධනය

කිරීම හා පීඩිත ජනතාවගේ ව්‍යාපාරවලට සහාය වීම බවයි. ඔහු විශ්වාස කළේ අධ්‍යාපනය ජනතාව සඳහා භාවිත කළ යුතු මෙවලමක් බවයි. එම නිසා ඔහු සාම්ප්‍රදායික බුද්ධිමය පන්තියට විරුද්ධව කටයුතු කළේය (Deng) Treiman, 1997: 309).

සංස්කෘතික විප්ලවය (1966-1976)

මාඕ විසින් ආරම්භ කළ සංස්කෘතික විප්ලවය හරහා විශ්වවිද්‍යාල, පාසල් සහ උසස් අධ්‍යාපන ආයතන වසා දැමූ අතර, දේශපාලන දැඩි අවධානයක් යටතේ අධ්‍යාපනය සිදු විය. "රතු ආදර්ශය'' (Red Model) යටතේ දේශපාලන අවබෝධය උසස් කළ යුතු යැයි ඔහු විශ්වාස කළේය (Fairbank, 2006: 421-423).

'ග්‍රාමීය අධ්‍යාපනය' අභිප්‍රාය

මාඕ සේතුං ග්‍රාමීය පදනම් වූ අධ්‍යාපන පද්ධතියක් පවත්වා ගෙන යාමට උත්සාහ කළේය. "ෂාන්ෂියාන්'' (Shanxiaxian) ක්‍රමය යටතේ ගුරුවරුන් හා සිසුන් ග්‍රාමීය ප්‍රදේශවලට යැවීම සිදු විය (Pepper, Suzanne, 1996: 265).

ශිෂ්‍යයන්ට දේශපාලන අධ්‍යාපනය

මාඕ නිරන්තරව අවධාරණය කළේ ශිෂ්‍යයන්ට ''දේශපාලන වශයෙන් උගත් විය යුතු බවයි". පාසල්වල දේශපාලන සාකච්ඡා, සමාජ සේවා සහ විප්ලවීය ලේඛන කියවීම අනිවාර්ය කළේය (Spence, 1996: 585-589).

**ප්‍රතිඵල**

අධ්‍යාපනමය ගැලැප්පීම

අධ්‍යාපන පද්ධතියේ ගැලැප්පීමක් සිදුවිය. විශේෂයෙන් විශ්වවිද්‍යාල වසා දැමීම හා බහුතර සිසුන් වැඩ අත්දැකීම් සඳහා ගම්වලට යැවීම හේතුවෙන් බුද්ධිමය ප්‍රගතිය අඩාල විය (Deng &Treiman,1997: 309).

ගුරුවරුන්ට හා බුද්ධිමත් පන්තියට වද හිම්වීම

සංස්කෘතික විප්ලවයේදී ගුරුවරුන් වන්දි නියෝජිතයන් ලෙස සැලකූ නිසා බොහෝ දෙනා පීඩා විඳින ලදී. ඒ නිසා ගුරුවරුන්ගේ භූමිකාව පහල විය (Fairbank) Goldman, 2006: 425).

අධ්‍යාපන අවකාශයන්හි අසමත්භාවය

බහුතර සිසුන්ට ක්‍රමවත් අධ්‍යාපනයක් නොලැබුණු අතර 1970 දශකය අවසන් වනවිට චීනයේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය බිඳ වැටී තිබුණි. ඇතැම් විට මෙම ප්‍රතිපත්ති තුළින් පොදු අධ්‍යාපනය පිළිබඳ ජනතාවගේ අවධානය වැඩි වූවත්, දිගුකාලීනව දැක්වූ විට චීනයේ අධ්‍යාපනමය සංවර්ධනයට දැඩි බාධාවක් විය (Pepper, 1996: 270–271).

**මාඕ සේතුංගේ දර්ශනයේ අඩංගු අධ්‍යාපනික සංකල්ප**

යාවජීව අධ්‍යාපනය

ළමා අවධියට පමණක් සීමා වී තිබූ චීනයේ අධ්‍යාපනය වෙනස් වන්නට විය. උපතේ සිට මරණය දක්වා නිසිලෙස හැදෑරිය හැකි අධ්‍යාපන ක්‍රියාවලියක් මේ තුළින් හඳුන්වා දෙන ලදී. නව අවුරුදු පනත මගින් චීනයේ ප්‍රාථමික පාසල් අධ්‍යාපනය ක්‍රියාවට නංවන ලදී. කනිෂ්ඨ මධ්‍ය පාසල, ජ්‍යෙෂ්ඨ උසස් පාසල හෝ වෘත්තීය පාසල්, විශ්වවිද්‍යාල හෝ කොලේජ් අධ්‍යාපන ආදී වශයෙන් අධ්‍යාපනය හැදෑරිය හැකි අතර විදෙස් අධ්‍යාපනය ලබා ගැනීමට ඉඩ ප්‍රස්ථාව ලබා දෙන ලදී.

අඛණ්ඩ අධ්‍යාපනය

ප්‍රාථමික අවධියේ සිට දරුවෙකුට නිසිලෙස අධ්‍යාපනය හැදෑරීමට ඉඩ ප්‍රස්ථාව ලබාදීම මෙමගින් හඳුන්වා සිදු විය. 1985 අධ්‍යාපන ප්‍රතිසංස්කරණය මගින් චීනයේ පෙර පාසල් අධ්‍යාපනයට නව පුනර්ජීවයක් ලබා දෙන ලදී. ඉන් පසු වයස අවුරුදු 6-11 දක්වා ප්‍රාථමික පාසල් අධ්‍යාපනයද අවුරුදු 12-14 දක්වා කනිෂ්ඨ මධ්‍ය පාසල් අධ්‍යාපනයද අවුරුදු 15 - 17 දක්වා ජ්‍යෙෂ්ඨ උසස් පාසල්

හෝ වෘත්තීය පාසල් අධ්‍යාපනයද අවුරුදු 18 -22 දක්වා විශ්වවිද්‍යාල හෝ කොලේජ් අධ්‍යාපනයද ලබා දෙන ලදී. තවද විදෙස් අධ්‍යාපනය ලැබීමට ඇති ඉඩ ප්‍රස්ථාවද ලබා දෙන ලදී.

වැඩිදුර අධ්‍යාපනය

චීනයේ වැඩිදුර අධ්‍යාපනය සඳහා ජ්‍යෙෂ්ඨ උසස් පාසල් අධ්‍යාපනය හඳුන්වා දෙන ලදී. ඒ සඳහා ජ්‍යෙෂ්ඨ උසස් පාසල් ඇතුළත් වීමේ පරීක්ෂණයෙන් සමත් විය යුතු විය. මෙම උසස් විදුහල පූර්ව විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබා දෙන පාසල් ලෙස පිළිගැනේ. 1986 දී නිකුත් කරන ලද වෘත්තීය අධ්‍යාපන පනත යටතේ වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයට උසස්තම වෘත්තීය පාසල්, විවිධ කුසලතා පාසල්, වෘත්තීය උසස් පාසල් ආදී වශයෙන් වැඩිදුර අධ්‍යාපනය හැදෑරීමට අවස්ථාව ලබා දෙන ලදී. තවද ශිෂ්‍ය හුවමාරු ක්‍රමයට ප්‍රමුඛස්ථානය ලබාදෙමින් චීන සිසුන් විවිධ රටවලට යවා විවිධ ක්ෂේත්‍රවල උසස් අධ්‍යාපනය ලබා ගන්නා ලදී.

සර්වජන පොදු අධ්‍යාපනය

මේ තුළින් රටේ සිටින උසස් පාන්තිකයන්ට මෙන්ම සමාජ පහළ පාන්තිකයන්ටද, ගම්බද ප්‍රදේශවල සිටින සිසුන්ට මෙන්ම නාගරික ප්‍රදේශවල සිටින සිසුන්ටද ආදී වශයෙන් රටේ සිටින සියලුම සිසුන්ට අධ්‍යාපනය හැදෑරිය හැකිවන සේ අධ්‍යාපනය නවීකරණය කිරීම මාඕ සේතුං විසින් සිදු කරන ලදී. 1966 -1976 දක්වා මාඕ සේතුං විසින් හඳුන්වා දෙන ලද සංස්කෘතික විප්ලවය මගින් ඈත ගම්බද ප්‍රදේශවල පවා අධ්‍යාපනය ව්‍යාප්ත කිරීම සිදු විය.

අනිවාර්ය පාසල් අධ්‍යාපනය

අනිවාර්ය පාසල් අධ්‍යාපනය යනුවෙන් මාඕ සේතුං චීනයේ සිසුන්ට අධ්‍යාපනය හැදෑරීමට ඇති අවස්ථාව ලබා දෙන ලදී. සියලුම සිසුන් අනිවාර්යයෙන් අධ්‍යාපනය ලැබීම තුළින් උගත් බුද්ධිමත් සමාජයක් බිහි කර ගැනීමට උත්සාහයක් ගත් බව දක්නට ලැබේ. 1965 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මගින් රාජ්‍ය අධ්‍යාපන කොමිසම ස්ථාපිත කරන ලද අතර අවුරුදු නමයක අනිවාර්ය අධ්‍යාපන කාලය සම්මත

කරන ලදී. 1891-1985 කාලය තුළ 72%ක අමතර මුදලක් අධ්‍යාපනයට අයවැය ලේඛනයෙන් වෙන් කරන ලදී. මෙම පනත ක්‍රියාත්මක කිරීම තුළින් ප්‍රාථමික පාසල් අවසානයේදී පාසල් හැර යාම අවම කරන ලදී. ඒ සඳහා වෘත්තීය හා තාක්ෂණික කුසලතා වර්ධනය කරන පාසල් ඇති කරන ලදී.

**වෘත්තීය හා තාක්ෂණික අධ්‍යාපනය**

සිසුන් තුළ පවතින හැකියා හා දක්ෂතා සංවර්ධනය කරමින් ඔවුන් රටේ වර්ධන ක්‍රියාවලිය සඳහා යොදවා ගැනීමේ අරමුණින් වෘත්තීය හා තාක්ෂණික අධ්‍යාපනය ලබා දෙන ලදී.

- 1986 දී වෘත්තීය අධ්‍යාපන පනත ක්‍රියාත්මක කරන ලදී. ඒ තුළින් උසස්තම වෘත්තීය පාසල්, ද්විතීයික පාසල්, රැකියා සොයා යන මධ්‍යස්ථාන හා අනෙකුත් වැඩිහිටි කුසලතා සහ සමාජ පුහුණු කිරීමේ අභ්‍යාස ආයතන ඇති කරන ලදී.
- 1976 දී තාක්ෂණික හා කාර්මික අධ්‍යාපනය යළි පණ ගැන්වීම
- නව අවුරුදු අනිවාර්ය පාසල් අධ්‍යාපන පනත ක්‍රියාත්මක වීමත් සමඟ ප්‍රාථමික පාසල් හැර යාම අවම කරමින් වෘත්තීය හා තාක්ෂණික කුසලතා වර්ධනය කරන පාසල් වර්ධනය කිරීම

**ප්‍රායෝගික අධ්‍යාපනය**

ප්‍රායෝගික අධ්‍යාපනය තුළින් සිසුන්ට මනා අධ්‍යාපනයක් ලබා දිය හැකිය. මාඕ සේතුං තම රටේ ජනතාවට දැනුම නිවැරදි ලෙස ලබාදීම සඳහා ප්‍රායෝගික අධ්‍යාපනයට යොමු කරවීමට උත්සාහ ගත් බව දක්නට ලැබේ.

- හතරවන වසරේ සිට ඵලදායි ලෙස ශ්‍රමය වැය කිරීමටත් ප්‍රායෝගික අත්දැකීම් ලබා ගැනීමටත් ගොවි බිම්වලට හෝ වැඩපලවල්වලට සම්බන්ධ වී ක්‍රියා කිරීමටත් අවස්ථාව ලබා දී ඇත.

## සදාචාර සංවර්ධනය සඳහා අධ්‍යාපනය

පුද්ගලයා තුළ යහපත් ආකල්ප වර්ධනය කිරීම තුළින් යහපත් සමාජයක් ගොඩ නැංවිය හැකිය. මේ හේතුවෙන් පුද්ගලයාගේ ආධ්‍යාත්මික සංවර්ධනය උදෙසා ප්‍රාථමික පාසල් විෂයමාලාවක් සඳහා

- සදාචාර පුහුණුවක් ලබාදීම
- මාතෘ භූමියට ආදරය කිරීම
- පක්ෂයට ආදරය කිරීම
- ජනතාවට ආදරය කිරීම ආදී විෂයයන් ඇතුළත් කරන ලදී.

මේ ආකාරයට මාඕ සේතුං විසින් චීනයේ සංවර්ධනය උදෙසා අධ්‍යාපන සංකල්ප යොදාගත් ආකාරය පෙන්වා දිය හැකිය.

## චීනයේ අධ්‍යාපන විෂයමාලා සකස් කිරීම

චීනයේ අධ්‍යාපන විෂයමාලා පිළිබඳ විග්‍රහයක් පහත දක්වා ඇත. මෙය විශේෂයෙන් මාඕ සෙතුන්ගේ යුගය 1949-1976 සහ පසුව එවකට සිදුවූ වෙනස්කම් ලෙස සඳහන් කළ හැකිය.

මාඕ සේතුංගේ යුගයේ (1949-1976) විෂයමාලා ගැඹුරු විශ්ලේෂණය

- මාඕ සේතුංගේ නායකත්වයෙන් යුත් චීන සමාජය සම්පූර්ණයෙන්ම සමාජවාදී විප්ලවය කරා යොමු වූ අතර, අධ්‍යාපනයත් ඒ සඳහා භාවිත කළ යුතු මෙවලමක් විය.

දේශපාලන පදනම් සහිත විෂයන්

“මාඕ සේතුංගේ සිතුවිලි” (Mao Zedong Thought) යන විෂයය අනිවාර්ය වශයෙන් පාසල්වල සහ විශ්වවිද්‍යාලවල උගන්වනු ලැබීය. සමාජවාදී විප්ලවය, ශ්‍රමය, කාර්මික දෘෂ්ටිකෝණ සහ ‘‘නිෂ්පාදනයෙන් ඉගෙනීම” යන අදහස් විෂයමාලාවේ කේන්ද්‍ර කෙරුණි.

ක්‍රියාකාරී විෂයමාලා සැලසුම

"දැනුමෙන් වඩා වැඩිම තැනට ඇරඹුමක් වන්නේ ශ්‍රමයෙනි" යන අදහස යටතේ සිසුන් ක්ෂේත්‍රීය අත්දැකීම් සඳහා ගොවිපල, කර්මාන්ත ශාලා, ගෙවතු ආදී ස්ථානවලට යැවූහ. න්‍යායාත්මක ඉගැන්වීමට වඩා ප්‍රායෝගික හා ශ්‍රමය පිළිබඳ දැනුමට වඩා වැඩි තැනක් දෙන ලදී.

සාම්ප්‍රදායික විෂයන්ගේ පහළවීම

ගණිතය, විද්‍යාව, භෞතික විද්‍යාව, ජීව විද්‍යාව වැනි විෂයන් වැළැක් වී පසෙක දැමුණි. බෞද්ධික විෂයන් "බූර්ජවා ආවරණය" ලෙස සලකන ලදී. බෞද්ධික විෂයන් බූර්ජවා ආවරණය යන්නෙන් අදහස් කරන්නේ සමාජයේ පවතින පීඩක ව්‍යවස්ථාවන්ට සහ බූර්ජවාදය පාලන ක්‍රමවලට සහාය වීමට බෞද්ධික විෂයන්, විශේෂයෙන් සමාජ විද්‍යාව, දර්ශනය, ඉතිහාසයේ වැනි විෂයන් භාවිත වීමයි. මෙය මාක්ස්වාදී (Marxist) විවරණයකි. මෙහිදීම පවසන්නේ බූර්ජවායෝ (Bourgeoisie අයිතිවාසිකම් පැවැත්වෙන පංති) තම බලය තහවුරු කර ගැනීම සඳහා විද්‍යාව, ශික්ෂණය, හා බුද්ධිමත් සංස්කෘතික ක්‍රියාකාරකම් භාවිත කරන බවයි. උදාහරණ ලෙස, පාසල් පද්ධතියක් හෝ විශ්වවිද්‍යාල පද්ධතියක් තුළින් පාඨමාලා නිර්මාණය කිරීමේදී, පීඩනය පන්තිභේදය, විරෝධය වැනි මාතෘකා දුරු කිරීමක් සිදුවිය හැකිය. එමගින් දරුවන් හෝ සිසුන් වෙත පවතින සමාජ ව්‍යවස්ථාව පිළිබඳ විකල්ප අදහස් නො පිරිනැමීමක් සිදුවේ. එමගින් බෞද්ධික විෂයයන් බූර්ජවා ආවරණයට ලක්වෙයි. නිදහස් හා විවෘත විමසුම් සඳහා නොවෙයි, පවතින පීඩක සමාජ සංවිධානය තිරසාර කිරීමට උපකාරී ලෙස හැඩගැන්වෙයි, යනුවෙන් පැහැදිලි කර ඇත (Fairbank and Goldman, 2006: 421).

සංස්කෘතික විප්ලවය 1966–1976 සහ විෂයමාලා විනාශය

පාසල් වසා දැමූ අතර, අධ්‍යාපන ආයතන බහුතරයක ක්‍රියාකාරිත්වය නවතා දැමීය.

"චීන රතු ගඩොල් පොත'' Little Red Book පාඨමාලාවේ මූලික පොතක් ලෙස භාවිත විය.

උසස් අධ්‍යාපනය වඩාත් දේශපාලන ලක්ෂ්‍යයක් විය, විශේෂයෙන් තාක්ෂණික/විද්‍යාත්මක විෂයයන් අසලකුණු කරන ලදී (Spence, 1999: 588).

**විප්ලවයෙන් පසුකාලීන (1976න් පසු) විෂයමාලා ප්‍රතිසංස්කරණ**

1976 පසු එනම් මාඕගේ මරණයෙන් පසු (Deng Xiaoping) නායකත්වය යටතේ විෂයමාලා ප්‍රතිසංස්කරණය කරන ලදී. ගණිතය, විද්‍යාව, තාක්ෂණය, ඉතිහාසය ආදී විෂයන් නැවත ප්‍රාථමිකත්වයට ගෙනෙන ලදී.

විද්‍යාල හා විශ්වවිද්‍යාලවල විෂයමාලා අධිගුණාත්මක කළ අතර, ජාත්‍යන්තර උපාධි මට්ටමට සමාන කිරීමක් සිදු විය (Deng & Treiman, 1997: 410).

**මාඕ සේතුංගේ අධ්‍යාපන දර්ශනයට අනුව විෂයමාලාව සකස් වී ඇති අයුරු**

මෙම යුගයේදී අධ්‍යාපනය සම්පූර්ණයෙන්ම සමාජවාදී හා දේශපාලන පදනමක් මත හැඩ ගැන්වීය. විෂයමාලා සම්ප්‍රදායික සත්‍ය හා විද්‍යාත්මක අන්තර්ගතවලට වඩා විප්ලවීය අදහස් මත පදනම් විය.

**ප්‍රධාන විෂයන්**

දේශපාලන විෂයන්:

"මාඕ සේතුංගේ සිතුවිලි'' (Mao Zedong& Thought)

මාර්ක්ස් වාදය, ලෙනින් වාදය

දේශපාලන සාකච්ඡා හා සාමාජික ක්‍රියාකාරකම්

අත්දැකීම් මගින් ඉගෙනීම:

Learn from the peasants and workers යන නීතියට අනුව ගොවිපලවල වැඩ කිරීම, කර්මාන්තශාලා දැනුම, විද්‍යාලයක ඉගෙනීම මෙන්ම භෞතික අත්දැකීම් ලබා ගැනීම

විද්‍යාත්මක විෂයන්ගේ අවහිර වීම:

ගණිතය, විද්‍යාව වැනි විෂයන් අඩු විය. බහුතරයෙන්ම ගුරුවරුන් දේශපාලනව "නිවැරදි" දැනුමක් පමණක් ඉගැන්වීමට යෙදවූහ.

**නව ආර්ථික විවෘත ප්‍රතිපත්තිවලින් පසු යුගය (1978 සිට වර්තමානය)**

මාඕගේ මරණයෙන් පසුව (1976), Deng Xiaoping) විසින් ආරම්භ කළ ආර්ථික විවෘත ප්‍රතිපත්තිය යටතේ අධ්‍යාපන ක්ෂේත්‍රය සාරවත් සංවර්ධනයක් දැක්වීය.

**ප්‍රධාන විෂයන්**

විද්‍යාත්මක හා තාක්ෂණික විෂයන් නැවත ආරම්භ කරන ලදී.

STEM (Science, Technology, Engineering, Math) ආශ්‍රිත විෂයන් වර්ධනය විය.

අභ්‍යන්තර හා ජාත්‍යන්තර විද්‍යාත්මක සම්මතයන්ට යටත්ව විෂයමාලා සංවර්ධනය විය.

ජාත්‍යන්තර සම්මතයන්ට ගැළපෙන විෂයමාලා:

UNESCO, OECD මට්ටමින් සමාන පද්ධති, විදේශ විශ්වවිද්‍යාල හා විද්‍යානුක්‍රම වැනි සම්බන්ධතා ගොඩනගා ගැනීම මෙයින් සිදු විය.

විෂය කාණ්ඩ

ප්‍රාථමික සහ ද්විතීයික අධ්‍යාපනය සඳහා චීන භාෂාව, ගණිතය, ඉතිහාසය, භූගෝල විද්‍යාව, දේශපාලන විද්‍යාව, සෞඛ්‍යය, ඉංග්‍රීසි වැනි විෂයන් එකතු විය. උසස් අධ්‍යාපනය සඳහා වෘත්තීය, ඉංජිනේරු, ව්‍යාපාරික, වෛද්‍ය, තොරතුරු තාක්ෂණය, නවෝත්පාදන පදනම් විෂයයන් සම්බන්ධ කරන ලදී.

**මාඕ සේතුංගේ දර්ශනය තුළින් ලාංකික අධ්‍යාපනයට ලබාගත හැකි ආදර්ශ**

වර්ෂ 1949 වර්ෂයේදී මාඕ සේතුංගේ විප්ලවීය ජයග්‍රහණයෙන් පසු චීන අධ්‍යාපනයේ නව මංපෙත් විවර කරන ලදී. 1949 චීන ජනගහනය වූ මිලියන 500 න් 80% කටම සාක්ෂරතාව නොවී ය. මාඕ සේතුංගේ අනුග්‍රහයෙන් අධ්‍යාපනය ලබා ගැනීමේ අවශ්‍යතාව අවධාරණය කර, සියලු දෙනාටම අධ්‍යාපනය ලබාදීමේ දැවැන්ත මෙහෙයුමක් ක්‍රියාත්මක කරන ලදී.

මාඕ සේතුංගේ අධ්‍යාපන දර්ශනය වත්මන් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන අධ්‍යාපන ක්‍රියාවලියට දායක කර ගැනීම වඩාත් ඵලදායක වේ. ශ්‍රී ලංකාවේ සාක්ෂරතා ප්‍රතිශතය දැනට 90%කට පමණටත් වඩා ඉහළ ප්‍රතිශතයක් ගනී. මෙලෙස සංවර්ධනය වූ අධ්‍යාපන ක්‍රියාවලිය සඳහා මාඕ සේතුංගේ අධ්‍යාපන දර්ශනය තුළින් ආදර්ශ ලබා ගැනීමද ඉන් ශ්‍රී ලාංකීය අධ්‍යාපන ක්‍රියාවලියද ප්‍රගතිශීලී ලෙස වර්ධනයට දායක කරගත යුතු ය.

චීන රජය පූර්ණ පෞරුෂ වර්ධනයකින් හෙබි පුද්ගලයකු බිහිකිරීමට අධ්‍යාපන ක්‍රියාවලිය දායක කොටගෙන ඇති අතර එතුළින් ලාංකේය අධ්‍යාපනයේ සඵලතාවය ද සිදුවිය යුත්තේ යථොක්තව සඳහන් කළ අයුරිනි. තවද මෙතුළින් ප්‍රජානන, ආවේදන, මනෝචාලක යන අංශ තුළින් විද්‍යමාන කරයි.

චීනය තුළ ක්‍රියාත්මක වන අධ්‍යාපන පද්ධතියේ ප්‍රාථමික, කණිෂ්ඨ, ජ්‍යෙෂ්ඨ, වෘත්තීය පාසල් හා විශ්වවිද්‍යාල හා කොලීජ් අධ්‍යාපන ආයතන ලෙස වර්ගීකරණයට ලක් වේ. මෙලෙසින් ම ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතියට පෘථුල අධ්‍යාපන ක්‍රමයක් ලබාදීමේ අරමුණින් ප්‍රාථමික, ද්විතීයික, පාසල් හා වෘත්තීමය දැනුම කුසලතා ලබාදීමට විවිධ වූ පාඨමාලාද (NVQ වැනි ) විශ්වවිද්‍යාල යන ආයතන බිහි කරලීම ද (අධ්‍යාපන ආයතන) ඒ තුළින් උසස් අධ්‍යාපනය ළඟාකර දී බුද්ධිමත් මානව සම්පතක් රටට දායාද කිරීමට උත්සහ ගැනීමද චීන අධ්‍යාපනය තුළින් ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයට ගතහැකි ආදර්ශයක් වේ. මීට අමතරව,

- සියලු දෙනාටම අනිවාර්ය වූ අධ්‍යාපන ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම
- සම අධ්‍යාපන අවස්ථා සංකල්පයට ප්‍රමුඛතාව ලබාදීම
- අධ්‍යාපනය සඳහා මූල්‍ය ආධාර ලබාදීම
- අන්තර්ජාතික වශයෙන් ශිෂ්‍ය හුවමාරු ක්‍රමයකට අවස්ථාව ලබාදීම
- අධ්‍යාපනය සඳහා ඉහළ ආයෝජනයක් ලබාදීම
- පාඨමාලා ප්‍රතිසංස්කරණය කිරීම
- අපචාරී ක්‍රියාවලට යෙදී සිටින සිසුන් මුදවා ගෙන අධ්‍යාපනය ලබාදීම
- පාසල් සංඛ්‍යාව හා සුදුසුකම්ලත් ගුරුවරුන්ගේ සංඛ්‍යාව වැඩි කිරීම
- වෘත්තීය හා තාක්ෂණික අධ්‍යාපනය වැඩිදියුණු කිරීම
- ප්‍රායෝගික අත්දැකීම් ලබාදීමට අවස්ථාව සැලසීම
- උසස් අධ්‍යාපන ක්ෂේත්‍රවල බඳවා ගැනීම්, උසස්වීම් යන සියල්ල දේශපාලන බලපෑමකින් තොරව ස්වාධීන පූර්ණ බලතල සහිතව ඒ ඒ ආයතනවලට නිදහසේ කටයුතු කිරීමට අවස්ථාව ලබාදීම
- විෂයමාලාවේ කිසියම් ගුණාත්මක වර්ධනයක්, සැමට සමාන විෂයමාලාවක් හඳුන්වා දීම, නිර්දේශ ග්‍රන්ථ, විභාග හා ගුරුවරුන්ගේ සුදුසුකම් යන සියල්ල පිළිගත් ඉහළ තලයකට නංවාලීමට කටයුතු කිරීම

මාඕ සේතුංගේ සුවිශේෂ වූ දර්ශනයන් ශ්‍රී ලංකාවට මෙන් ම සමස්ත ලොවට ම වැඩදායි පුරවැසියන් බිහිකරලීමට මූලාශ්‍ර කොටගත යුතු ය.

**මාඕ සේතුංට අනුව ගුරුවරයාගේ ස්වභාවය**

1966-1976 දක්වා මාඕ සේතුං විසින් හඳුන්වා දෙන ලද සංස්කෘතික විප්ලවය මගින් ඈත ගම්බද ප්‍රදේශවල පවා අධ්‍යාපනය ව්‍යාප්ත කෙරුණි. උපදින හා ජීවත් වන සෑම දරුවෙකුම අකුරු උගත් ජනතාව බවට පත් කරලීම හා ඒ ඒ ගම්වල පැවති පාරම්පරික සාම්ප්‍රදායික ඥානය අධ්‍යාපනයට බද්ධ කරලීම මෙතුමාගේ අරමුණ විය. ඒ අරමුණ සාක්ෂාත් කර ගනු පිණිස කැප වන ගුරුවරයාගේ ස්වභාවය ද මාඕ සේතුං පෙන්වා දී තිබේ.

ආබාධ සහිත ළමයින්ට හා සෙමෙන් ඉගෙන ගන්නා ළමයින්ට විශේෂයෙන් සකසන ලද වෙනස් වූ අධ්‍යාපන ක්‍රියාවලියක් වැඩිදියුණු කර ලබාදීම ගුරුවරයාගේ ස්වභාවය වෙයි. එසේම දක්ෂ ළමයින්ට ඉහළ පන්තිවලට ද්විතීයික උසස්වීම් ලබාදෙමින් ඔවුන්ව උපස්ථම්භනයට පත් කිරීමත්, සෙමෙන් ඉගෙන ගන්නා සිසුන්ට ප්‍රතිකාර්ය ඉගැන්වීම් ක්‍රම හඳුන්වාදීමත් මාඕ සේතුං දක්වන ගුරුවරයාගේ ස්වභාවය වෙයි. එසේම පාසැල් අධ්‍යාපනය හමාර කිරීමට සූදානම් වන සිසුවාට වෘත්තීය අධ්‍යාපනය ලබා දීමත් ඒ තුළින් ඔහු සමාජය තුළ ස්ථාවරත්වයකට පත් කිරීමටත් සැබෑ ගුරුවරයාගේ ස්වභාවය වෙයි. තවද මාඕ සේතුං දකින ගුරුවරයා නිරන්තරයෙන් දැනුමෙන් මෙන්ම යහපත ආකල්පවලින්ද පිරිපුන් කුසලතාවලින්ද යුක්ත විය යුතු බව පෙන්වා දී තිබේ.

**මාඕ සේතුංගේ දර්ශනයට අනුව හොඳ ගුරුවරයකු සතු ලක්ෂණ**

චීනය වැඩවසම් සමාජය අධ්‍යාපනය කෙරෙහි විශාල අවධානයක් යොමු කළ අතර එය ප්‍රධාන වශයෙන් අංශ දෙකකින් පිළිබිඹු වේ. එනම් ගුරුවරුන්ගේ ගෞරවනීය තත්ත්වය ඉස්මතු කිරීම සහ සමාජය පුරා ගුරුවරුන්ට ගෞරවය ප්‍රවර්ධනය කිරීම, පාලකයන්, ගුරුවරුන් රට පාලනය කිරීම සඳහා මූලික බව විශ්වාස කරමින් ෂුන්සි ස්වර්ගය මුතුන්මිත්තං සහ පාලකයන්, ගුරුවරුන් සමාන කිරීමට යෝජනා කළේය. ප්‍රසිද්ධ ටැන් රාජ්‍යවංශ චින්තකයකු වන හන් යූ ද ගුරුවරුන්ගේ කාර්යභාරය "සත්‍ය සම්ප්‍රේෂණය කිරීම, දැනුම ලබාදීම සහ සැකයන් විසඳීම" බව පෙන්වා දුන්නේය. දැනුම සහ සැකයන් පවතින තාක් කල් ගුරුවරුන්ද එසේ කරන බව

අවධාරණය කළේය. සාම්ප්‍රදායික චීන පාසල්වල ෂිකාශි සහ සිටියන් වැනි උත්සව පාසල ආරම්භයේදී හෝ එහි ස්ථාපිත කිරීමේ පැරණි ඍෂිවරුන්ට සහ ගුරුවරුන්ට නමස්කාර කිරීම සඳහා පවත්වන ලදී. වැඩවසම් සමාජය තුළ අධිරාජ්‍යයන් සහ යටත් වැසියන් දෙදෙනාම අධ්‍යාපනය සැලකුවේ පූජනීය වෘත්තියක් ලෙස මිස හෙළා දැකීමට හෝ අපකීර්තියට පත් කිරීමට නොවෙයි. දේශපාලන සහභාගි වීම සඳහා විද්වතුන් ආකර්ෂණය කර ගැනීම සඳහා වැඩවසම් රාජ්‍යය අධිරාජ්‍යය විභාග ක්‍රමද භාවිත කළ අතර එමඟින් අධ්‍යාපනය කෙරෙහි ගෞරවයක් ඇති සංස්කෘතියක් මානසිකත්වයක් ඇති විය.

රටක ඉදිරි අනාගතයේදී පැවතිය හැකි ප්‍රවණතාවන්ට යෝග්‍ය අයුරකට අධ්‍යාපනය ලබා දීම සැලසුම් සහගත ව සිදු කිරීම යහපත් ගුරුවරයා සතු ලක්‍ෂණයකි. එසේම පන්ති කාමරයේ සිටින ශිෂ්‍යයන්ගේ දක්ෂතා හඳුනා ගෙන විශේෂ දක්ෂතා ඇති සිසුන්ට එම දක්ෂතා වැඩි දියුණු කර ගැනීමට ඉඩ සලසන අතර ම සාමාන්‍ය දක්ෂතා දක්වන සිසුන්ට ඔවුන්ගේ දක්ෂතාවලට අනුකූලව අංශයකට නැඹුරු කිරීමට පෙළඹවීමක් යහපත් ගුරුවරයා සතු ලක්ෂණයක් බව පෙන්වා දී තිබේ. තව ද සමහර අති දුෂ්කර කලාපවල ගුරුවරුන් සේවය කිරීමට දැඩි අකමැත්තක් දක්වන අතර ඔවුන් තම රැකියාව නොව තම පෞද්ගලික ජීවිතය වෙනුවෙන් කැප වෙයි. මාඕ සේතුං දකින යහපත් ගුරුවරයා ඕනෑම දුෂ්කර කාර්යයක් කරමින් දුෂ්කර කාලයක් ගෙවා දමමින් තම සේවය ඉටු කිරීමට සූදානම් විය යුතු ය. එසේම සුහග ළමුන්ට පමණක් නොව තරමක් දුර්වල ළමුන්ටත් ඉගෙනුම ඉගැන්වීම් ක්‍රියාවලිය සිදුකළ යුතුය. ඒ සඳහා විවිධ වූ ප්‍රතිකාර ක්‍රම අනුගමනය කිරීම ඒ වෙනුවෙන් කැපවීමත් යහපත් ගුරුවරයා සතු ලක්ෂණයකි.

**මාඕ සේතුංගේ දර්ශනයට අනුව ශිෂ්‍ය ස්වභාවය**

මාඕ සේතුංගේ දර්ශනයට අනුව ශිෂ්‍යයාට ශිල්ප ලබා දීමට ප්‍රථම ශිෂ්‍යයාගේ රුචි අරුචිකම් මෙන් ම ශිෂ්‍ය පෞරුෂය කෙරෙහි අවධානය යොමු කළ යුතු ය. පන්ති කාමරයේ සිසුවා සිටින මානසිකත්වය ඔහුගේ කැමැත්ත ආදිය විමසා බැලීම මගින් ඉතා සාර්ථක ලෙස ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ඉටු කර ගත හැකියි.

සිසුවා යම් ගැටලුකාරී තත්ත්වයකට මුහුණ පා සිටින්නේද, ඔහු යම් රෝගයකින් පීඩා විඳින්නේද, මේ ආදී වූ සියලුම දේ පිළිබඳව ගුරුවරයා දැන සිටීම ඉතා වැදගත්ය. එසේම දේශයක අධ්‍යාපනය කාලීන අවශ්‍යතා මත පදනම් විය යුතුය. ජාතියේ අවශ්‍යතා සපුරාලනු වස් අධ්‍යාපන ප්‍රතිපත්ති සැකසිය යුතු බව මෙතුමාගේ අධ්‍යාපන දර්ශනයෙන් ලබාගත හැකි පූර්වාදර්ශයක් ලෙස සඳහන් කළ හැකිය. ඉහත සඳහන් කරුණු ඇසුරෙන් මාඕ සේතුංගේ අධ්‍යාපන දර්ශනය පැහැදිලි කළ හැකිය.

**සාරාංශය**

මාඕ සේතුංගේ අධ්‍යාපන දර්ශනයට අදාළව කරුණු ගොනු කිරීමේ දී එතුමාගේ දෙමාපියන්, උපත, අධ්‍යාපනය සම්බන්ධව, කෙටි හැඳින්වීමක් සිදුකර ඇත. ඉක්බිතිව එතුමාගේ යුගය වන විට චීනයේ පැවති සාම්ප්‍රදායික අධ්‍යාපන ක්‍රම අවධි තුනක් යටතේ පැහැදිලි කර ඇත. අනතුරුව මාඕ සේතුංගේ අධ්‍යාපන දර්ශනය කුමක්ද යන්න මූලාශ්‍රගත කරුණු පදනම් කරගෙන විග්‍රහයක් සිදුකර තිබේ. ඔහුගේ අධ්‍යාපන දර්ශනයේ පැවැති මුඛ්‍ය පරමාර්ථ පිළිබඳවද කරුණු ගොනුකර ඇත. අනතුරුව මාඕගේ අධ්‍යාපන දර්ශනයේ අරමුණු, අධ්‍යාපන ප්‍රතිපත්ති, අධ්‍යාපන සංකල්ප පැහැදිලි කර ඇත. මාඕ දර්ශනයට අනුව විෂයමාලාව සකස් වූ අයුරු පැහැදිලි කර තිබේ. එම කරුණු පදනම් කරගෙන මෙතුමාගේ අධ්‍යාපන දර්ශනය තුළින් ලාංකික අධ්‍යාපනය ලබාගත හැකි ආදර්ශ පැහැදිලි කර ඇත. එසේම ඔහුගේ අධ්‍යාපන දර්ශනය තුළ ඔහු දකින නූතන ගුරුවරයාගේ ස්වභාවය පිළිබඳවද විග්‍රහයක් සිදු කර ඇත. එසේම ඔහුගේ දෘෂ්ටියට අනුව ශිෂ්‍ය ස්වභාවය පිළිබඳ හැඳින්වීමක්ද සිදුකර ඇත.

**මූලාශ්‍රය**

*අධ්‍යාපන මූලිකාංග ගුරු මාර්ගෝපදේශය* (2010). මහරගමඃ ජාතික අධ්‍යාපන ආයතනය.

විජේතුංග, හරිස්චන්ද්‍ර. (1963). *මාඕ සේතුංගේ කලාව හා සාහිත්‍ය.* ගොඩගේ ප්‍රකාශකයෝ.

Fairbank, J. K., & Goldman, M. (2006). *China: A New History* (2nd ed., p. 366). Belknap Press.

Spence, J. D. (1999). Mao Zedong. Viking Press. pp. 17–22.

Elman, B. A. (2000). *A Cultural History of Civil Examinations in Late Imperial China*. University of California Press. pp. 45–79.

Chang, L. (1955). *Education in Ancient China*. UNESCO: International Bureau of Education. pp. 101–120.

Schram, S. R. (1999). *The political thought of Mao Tse-tung*. Cambridge University Press.

Hannum, E. (1999). Political change and the urban-rural gap in basic education in China, 1949–1990. *Comparative Education* Review,43,2, 193–211. https://doi.org/10.1086/447556

Wilkinson, E. (2013). *Chinese History: A New Manual (4th ed.).* Harvard University Asia Center. pp. 240–266.

Rawski, E. S. (1979). *Education and Popular Literacy in Ch'ing China*. University of Michigan Press. pp. 50–88.

Chang, Liang. *Education in Ancient China*. UNESCO, 1955, pp. 101–120.

Elman, Benjamin A. *A Cultural History of Civil Examinations in Late Imperial China*. University of California Press, 2000, pp. 45–79.

Rawski, Evelyn S. *Education and Popular Literacy in Ch'ing China*. University of Michigan Press, 1979, pp. 50–88.

Wilkinson, Endymion. *Chinese History: A New Manual*. 4th ed., Harvard University Asia Center, 2013, pp. 240–266.

Hayhoe, R. (1999). *China's universities and the open door*. M.E. Sharpe.

Hannum, E. (1999). *Political change and the urban-rural gap in basic education in China*, 1949–1990. Comparative Education Review, 43(2), 193–211.

Pepper, S. (1996). *Radicalism and education reform in 20th-century China*. Cambridge University Press.

Tsang, M. C. (2000). *Education and national development in China since 1949: oscillating policies and enduring dilemmas*. China Review, 20(1), 1-24.

Kwong, J. (1994). *Ideological crisis among China's youth: Values and official ideology*. British Journal of Sociology of Education, 15(1), 27-44.

Yao, X. (2000). *An Introduction to Confucianism*. Cambridge University Press. p. 102.

Elman, B. A. (2000). *A Cultural History of Civil Examinations in Late Imperial China*. University of California Press. pp. 78–81.

Ebrey, P. B. (2003). *Women and the Family in Chinese History*. Routledge. p. 47.

Chang, L. (1955). *The Chinese Examination System and the Bureaucracy*. Harvard University Press. pp. 151–154.

Pepper, S. (1996). *Radicalism and Education Reform in 20th-Century China*. Cambridge University Press. p. 29.

Deng & Treiman (1997), *The Impact of the Cultural Revolution on Trends in Educational Attainment in the People's Republic of China*, American Journal of Sociology, p.304.

Fairbank, J. K., & Goldman, M. (2006). *China: A new history* (2nd enlarged ed., pp. 421–423). Harvard University Press.

Deng, Z., & Treiman, D. J. (1997). *The impact of the Cultural Revolution on trends in educational attainment in the People's Republic of China*. American Journal of Sociology, 103(2), 391–428.

PÈtiglione, G. A. (2011). *Education and Social Change in China*.

Ministry of Education of the People’s Republic of China (2021). *National Education Plan*.

Fairbank and Goldman (2006). stated that “in the Cultural Revolution, the traditional curriculum was abandoned, and political ideology replaced scientific and liberal knowledge” (p. 421).

Zhao, Z. (2004). *Educational Reform in China*. Education and Society, 22(2), p. 15.

Kwong, J. (1997). *The Politics of Curriculum Reform in China*. Comparative Education Review, 41(1), pp. 30–47.

OECD (2010). *Reviews of National Policies for Education*: China. Paris: OECD Publishing. p. 75.

Ministry of Education of the People’s Republic of China (2021). Policy on “Double Reduction”. Retrieved from www.moe.gov.cn